# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/3/37/3/9/ 441 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2024.01. 29

චක්‍රලේඛ අංක: 01/2024

සියලුම: පළාත් ප්‍රධාන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

**පාසල්වල අධ්‍යයන කාර්යමණ්ඩල බඳවා ගැනීම, ස්ථානගත කිරීම සහ ස්ථාන මාරු විධිමත් කිරීම සඳහා පාසල් වර්ගීකරණය**

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන හා ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සඳහා පහසුකම් පාදක පාසල් වර්ගීකරණය යන මැයෙන් නිකුත් කර ඇති අංක 2005/01 හා 2005.01.18 දිනැති අධ්‍යාපන ලේකම්ගේ චක්‍රලේඛය සහ දුෂ්කර හා අතිදුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල්වල ගුරු හිඟය පියවීම සඳහා ගුරුවරුන් බෙදා හැරීම දිරි ගැන්වීම පිණිස මූල්‍යමය දිරිදීමනාවක් ලබා දීම සඳහා පාසල් දුෂ්කර හා අතිදුෂ්කර ලෙස වර්ග කිරීම යන මැයෙන් නිකුත් කර ඇති අංක 2006/43 හා 2006.11.24 දිනැති අධ්‍යාපන ලේකම්ගේ චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර මෙම චක්‍රලේඛයේ විධිවිධාන මින් ඉදිරියට බල පැවැත්වේ.

2.0 අධ්‍යාපන ලේකම්ගේ අංක 2007/20 හා 2007.12.13 දිනැති චක්‍රලේඛය අනුව ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යාපන ලේකම්ගේ අංක 2006/44 හා 2006.11.27 දිනැති චක්‍රලේඛය අනුව දුෂ්කර හා අතිදුෂ්කර පාසල්වල සේවය කිරීම වෙනුවෙන් විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට දිරි දීමනා ගෙවීම සඳහා පාසල් වර්ගීකරණය කිරීම 2024.02.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම චක්‍රලේඛයේ විධි විධාන පරිදි සිදු කළ යුතුයි.

3.0 පළාත් මට්ටමින් පවතින ප්‍රාදේශීය, භූගෝලීය, ආර්ථික සහ යටිතල පහසුකම්වල විෂමතා සලකා දුෂ්කර ප්‍රදේශවල දරුවන් හට සම අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා සහ ගුණාත්මක අධ්‍යාපන අවස්ථා සලසා දීමේ අරමුණින් යුතුව ගුරු හිඟය පියවා ගුරුවරුන් රඳවා තබා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව අඛණ්ඩව සිදු කිරීම තුළින් පාසල් පද්ධතිය සක්‍රිය ව පවත්වා ගැනීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

4.0 මේ යටතේ පාසල්වල පවත්නා විවිධ භෞතික පහසුකම් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථානගත කිරීමේ පහසුව සැලකිල්ලට ගෙන පහත පරිදි පාසල් වර්ග කළ යුතු ය.

i. අතිදුෂ්කර පාසල්
ii. දුෂ්කර පාසල්
iii. පහසු පාසල්
iv. වඩාත් පහසු පාසල්

**5.0 පාසල් වර්ගීකරණය සඳහා නිර්ණායක අනුව ලකුණු පිරිනැමීම**

5.1 පාසල් වර්ගීකරණයේ දී කලාප/පළාත් මට්ටමින් පාසල් සඳහා ලකුණු ලබාදීමේ දී යොදා ගතයුතු නිර්ණායක සහ ලබා දෙන ලකුණු සංඛ්‍යා පහත වගු අංක 1හි දක්වා ඇත.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister: +94112784832, +94112784825
ලේකම් / செயலாளர் / Secretary: +94112784811, +94112785162

| අනු අංකය | | | | නිර්ණායක | ලකුණු |
|---|---|---|---|---|---|
| 1. | | | | **පාසලේ පවතින මූලික පහසුකම්** | 17 |
| | 1.1 | | | විදුලිබල පහසුකම් පැවතීම (ලංකා විදුලිබල මණ්ඩලයෙන් හෝ වෙනත් සුදුසු මූලාශ්‍රයකින්) | (02) |
| | | 1.1.1 | | පාසලට විදුලිබල පහසුකම් ඇත | 00 |
| | | 1.1.2 | | පාසලට විදුලිබල පහසුකම් නොමැත | 02 |
| | 1.2 | | | අංක 24/2016 හා 2016.09.06 දිනැති චක්‍රලේඛයේ හා පාසල් සැලසුම්කරණය පිළිබඳ මාර්ගෝදේශ සංග්‍රහයේ සඳහන් ජාතික ප්‍රතිමානවලට අනුව ප්‍රමාණවත් පරිදි සනීපාරක්ෂක පහසුකම් පැවතීම | (05) |
| | | 1.2.1 | | ජාතික ප්‍රතිමානවලට අනුව සනීපාරක්ෂක පහසුකම් 100%ක් පැවතීම | 00 |
| | | 1.2.2 | | ජාතික ප්‍රතිමානවලට අනුව සනීපාරක්ෂක පහසුකම් 75% -100% ක් පැවතීම | 01 |
| | | 1.2.3 | | ජාතික ප්‍රතිමානවලට අනුව සනීපාරක්ෂක පහසුකම් 50% -75% ක් පැවතීම | 02 |
| | | 1.2.4 | | ජාතික ප්‍රතිමානවලට අනුව සනීපාරක්ෂක පහසුකම් 25% - 50% ක් පැවතීම | 03 |
| | | 1.2.5 | | ජාතික ප්‍රතිමානවලට අනුව සනීපාරක්ෂක පහසුකම් 25% ට අඩුවෙන් පැවතීම | 05 |
| | 1.3 | | | පාසලේ පානීය ජල පහසුකම් පැවතීම | (05) |
| | | 1.3.1 | | වසර පුරා ක්‍රමවත්ව ජල පහසුකම් ඇත. | 00 |
| | | 1.3.2 | | මාස 6කට වැඩි කාලයක් ජල පහසුකම් ඇත. | 02 |
| | | 1.3.3 | | මාස 3 ත් 6 ත් අතර කාලයක් ජල පහසුකම් ඇත. | 03 |
| | | 1.3.4 | | මාස 3කට අඩු කාලයක් ජල පහසුකම් ඇත. | 05 |
| | 1.4 | | | පානීය නොවන අනෙකුත් අවශ්‍යතා සඳහා ජල පහසුකම් පැවතීම | (05) |
| | | 1.4.1 | | වසර පුරා ක්‍රමවත්ව ජල පහසුකම් ඇත. | 00 |
| | | 1.4.2 | | මාස 6කට වැඩි කාලයක් ජල පහසුකම් ඇත. | 02 |
| | | 1.4.3 | | මාස 3 ත් 6 ත් අතර කාලයක් ජල පහසුකම් ඇත. | 03 |
| | | 1.4.4 | | මාස 3කට අඩු කාලයක් ජල පහසුකම් ඇත. | 05 |
| | 1.5 | | | ආහාර පාන ලබා ගැනීමට ඇති පහසුකම් පැවතීම | (03) |
| | | 1.5.1 | | ප්‍රධාන ආහාර වේලක් ලබා ගත හැකි පරිදි පාසලේ ආපන ශාලාවක් ඇත. | 00 |
| | | 1.5.2 | | පාසලේ ආපන ශාලාවෙන් ප්‍රධාන ආහාර වේලක් ලබා ගැනීමේ පහසුකමක් නොමැත. | 03 |
| 2. | | | | **පාසලේ හෝ ප්‍රදේශයේ ඇති සන්නිවේදන පහසුකම් (දුරකථන හා අන්තර්ජාල)** | 10 |
| | 2.1 | | | පාසලේ ස්ථාවර දුරකථන හා අන්තර්ජාල පහසුකම් පැවතීම | (02) |
| | | 2.1.1 | | ස්ථාවර දුරකථන පහසුකම් | |
| | | | 2.1.1.1 | ස්ථාවර දුරකථන පහසුකම් ඇත | 00 |
| | | | 2.1.1.2 | ස්ථාවර දුරකථන පහසුකම් නැත | 01 |
| | | 2.1.2 | | ස්ථාවර අන්තර්ජාල පහසුකම් | |
| | | | 2.1.2.1 | අන්තර්ජාල පහසුකම් ඇත | 00 |
| | | | 2.1.2.2 | අන්තර්ජාල පහසුකම් නැත | 01 |
| | 2.2 | | | ජංගම දුරකථන /අන්තර්ජාල සංඥා පහසුකම් පැවතීම | (08) |
| | | 2.2.1 | | ජංගම දුරකථන සංඥා පහසුකම් පැවතීම | |
| | | | 2.2.1.1 | ජංගම දුරකථන සංඥා පහසුකම් ඇත | 00 |
| | | | 2.2.1.2 | කිසිදු ජංගම දුරකථන සංඥා පහසුකම් නැත | 04 |
| | | 2.2.2 | | අන්තර්ජාල සංඥා පහසුකම් පැවතීම | |
| | | | 2.2.2.1 | අන්තර්ජාල සංඥා පහසුකම් ඇත | 00 |
| | | | 2.2.2.2 | කිසිදු අන්තර්ජාල සංඥා පහසුකම් නැත | 04 |
| 3. | | | | **පොදු ප්‍රවාහන පහසුකම්** | 30 |
| | 3.1 | | | පාසලේ සිට ආසන්නතම බස් පාරට හෝ දුම්රිය නැවතුම්පලට ඇති දුර | (10) |
| | | 3.1.1 | | පොදු ප්‍රවාහන පහසුකම් අවසන් වන ස්ථානයේ සිට කි.මී. 1 කට වඩා අඩු දුරකින් පාසල පිහිටා තිබීම | 00 |
| | | 3.1.2 | | පොදු ප්‍රවාහන පහසුකම් අවසන් වන ස්ථානයේ සිට කි.මී. 1 ත් කි.මී. 2ත් අතර පාසල පිහිටා තිබීම | 02 |
| | | 3.1.3 | | පොදු ප්‍රවාහන පහසුකම් අවසන් වන ස්ථානයේ සිට කි.මී. 2 ත් කි.මී. 4ත් අතර | 04 |

| | | | | |
|---|---|---|---|---|
| | | | පාසල පිහිටා තිබීම | |
| | | 3.1.4 | පොදු ප්‍රවාහන පහසුකම් අවසන් වන ස්ථානයේ සිට කි.මී. 4 ත් කි.මී. 6ත් අතර පාසල පිහිටා තිබීම | 08 |
| | | 3.1.5 | පොදු ප්‍රවාහන පහසුකම් අවසන් වන ස්ථානයේ සිට කි.මී. 6ට වැඩි දුරකින් පාසල පිහිටා තිබීම | 10 |
| | 3.2 | | පොදු ප්‍රවාහන පහසුකම් අවසන් වන ස්ථානයේ සිට පාසලට ප්‍රවේශ වන මාර්ගයේ ස්වභාවය (කි.මී. 1 කට වඩා වැඩි දුරකින් පාසල පිහිටා තිබිය යුතුය.) | (10) |
| | | 3.2.1 | මෝටර් රථයකින් ගමන් කළ හැකි මාර්ගයකි | 00 |
| | | 3.2.2 | මෝටර් රථයකින් ගමන් කල නොහැකි වළගොඩැලි සහිත මාර්ගයකි | 05 |
| | | 3.2.3 | පඩිපෙල්/කඳු/ඒදඬු/ගිරිදුර්ග සහිත දුෂ්කර මාර්ගයකි | 10 |
| | 3.3 | | පාසල ආරම්භ කිරීමට නියමිත වේලාවට පෙර පැයක කාලයක් තුළ පොදු ප්‍රවාහන පහසුකම් පැවතීම | (05) |
| | | 3.3.1 | පොදු ප්‍රවාහන පහසුකම් වාර 04ට වඩා වැඩියෙන් පැවතීම | 00 |
| | | 3.3.2 | පොදු ප්‍රවාහන පහසුකම් වාර 01 – 04 අතර පමණක් පැවතීම | 02 |
| | | 3.3.3 | පොදු ප්‍රවාහන පහසුකම් වාර 01 පමණක් පැවතීම | 03 |
| | | 3.3.4 | පොදු ප්‍රවාහන පහසුකම් නොමැති වීම | 05 |
| | 3.4 | | පාසල නිම කළ වේලාවට පසුව පැයක කාලයක් තුළ පොදු ප්‍රවාහන පහසුකම් පැවතීම | (05) |
| | | 3.4.1 | පොදු ප්‍රවාහන පහසුකම් වාර 04ට වඩා වැඩියෙන් පැවතීම | 00 |
| | | 3.4.2 | පොදු ප්‍රවාහන පහසුකම් වාර 01 – 04 අතර පමණක් පැවතීම | 02 |
| | | 3.4.3 | පොදු ප්‍රවාහන පහසුකම් වාර 01 පමණක් පැවතීම | 03 |
| | | 3.4.4 | පොදු ප්‍රවාහන පහසුකම් නොමැති වීම | 05 |
| 4. | | | පාසලේ සිට මූලික පහසුකම් ලබා ගන්නා ස්ථාන වෙත ඇති දුර ප්‍රමාණ පිළිබඳ තොරතුරු | 13 |
| | 4.1 | | ආසන්නතම රජයේ රෝහලට ඇති දුර (මූලික/ ප්‍රාදේශීය හෝ ඊට වැඩි පහසුකම් සහිත රෝහලක් විය යුතුය) | (07) |
| | | 4.1.1 | පාසලේ සිට ඇති දුර කි.මී. 1 කට වඩා අඩුය | 00 |
| | | 4.1.2 | පාසලේ සිට ඇති දුර කි.මී. 1 ත් කි.මී. 2ත් අතර වේ | 01 |
| | | 4.1.3 | පාසලේ සිට ඇති දුර කි.මී. 2 ත් කි.මී. 4ත් අතර වේ. | 03 |
| | | 4.1.4 | පාසලේ සිට ඇති දුර කි.මී. 4 ත් කි.මී. 6ත් අතර වේ. | 05 |
| | | 4.1.5 | පාසලේ සිට ඇති දුර කි.මී 6ට වඩා වැඩි වේ. | 07 |
| | 4.2 | | ආසන්නතම රජයේ/ පෞද්ගලික බැංකු ශාඛාවට ඇති දුර (වාණිජ හෝ ඉතිරි කිරීමේ බැංකු පමණි) | (05) |
| | | 4.2.1 | පාසලේ සිට ඇති දුර කි.මී. 1 කට වඩා අඩුය | 00 |
| | | 4.2.2 | පාසලේ සිට ඇති දුර කි.මී. 1 ත් කි.මී. 2ත් අතර වේ | 02 |
| | | 4.2.3 | පාසලේ සිට ඇති දුර කි.මී. 2 ත් කි.මී. 4ත් අතර වේ. | 03 |
| | | 4.2.4 | පාසලේ සිට ඇති දුර කි.මී. 4 ත් කි.මී. 6ත් අතර වේ. | 04 |
| | | 4.2.5 | පාසලේ සිට ඇති දුර කි.මී. 6 ට වඩා වැඩි වේ. | 05 |
| 5. | | | වෙනත් පාසල් සඳහා ඇති මාර්ග දුර (එම මාධ්‍ය සහ එම ශ්‍රේණි ද සහිත) | **08** |
| | | 5.1 | පාසලේ සිට කි.මී. 2ට වඩා අඩු දුරකින් පාසලක්/පාසල් පිහිටා තිබීම | 00 |
| | | 5.2 | පාසලේ සිට කි.මී. 2ත් කි.මී. 4ත් අතර දුරකින් පාසලක්/පාසල් පිහිටා තිබීම | 02 |
| | | 5.3 | පාසලේ සිට කි.මී. 4ත් කි.මී. 6ත් අතර දුරකින් පාසලක්/පාසල් පිහිටා තිබීම | 06 |
| | | 5.4 | පාසලේ සිට කි.මී. 6 හෝ ඊට වඩා වැඩි දුරකින් පාසලක්/පාසල් පිහිටා තිබීම | 08 |
| | | | පොදු නිර්ණායක සඳහා ලකුණු එකතුව | 80 |
| 6. | | | පළාත් මට්ටමේ කමිටුව විසින් ප්‍රාදේශීය වශයෙන් හඳුනා ගනු ලබන භූගෝලීය හා සමාජීය දුෂ්කරතාවලට අදාළ නිර්ණායක සඳහා ලබා දෙන ලකුණු * | 20 |
| | | | මුළු ලකුණු | 100 |

වගු අංක 1 - ලකුණු ලබා දීමේ නිර්ණායක

* පළාත් මට්ටමේ කමිටුව විසින් තම ප්‍රදේශයේ භූගෝලීය හා සමාජීය දුෂ්කරතාවලට අදාළ නිර්ණායක හඳුනා ගැනීම කළ යුතු ආකාරය සම්බන්ධයෙන් 6.1 හි සඳහන් කර ඇත.

## 6.0 පාසල් වර්ගීකරණය කිරීම

### 6.1 පළාතේ සුවිශේෂීතාවට අදාළ නිර්ණායක හඳුනා ගැනීම

6.1.1 තම පළාතේ සුවිශේෂීතාවයට අදාළ නිර්ණායක හඳුනාගැනීම සඳහා පළාත් අධ්‍යාපන ලේකම් විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ සභාපතිත්වයෙන් යුත් සත් (07) සාමාජික කමිටුවක් පත් කළ යුතු අතර එම කමිටුවේ සංයුතිය පහත පරිදි විය යුතුය.

i. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සභාපති)
ii. පළාත් අධ්‍යාපන ලේකම් විසින් පත්කරන ලද නියෝජිතයෙකු
iii. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සැලසුම් විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
iv. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු
v. කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු

6.1.2 කමිටුවේ සාමාජිකයන් වශයෙන් කටයුතු කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් යටතේ ඇති කොට්ඨාසවල කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කමිටුවේ සාමාජිකයන් ලෙස පත් නොකළ යුතුයි.

6.1.3 පාසල් වර්ගීකරණය සඳහා ජාතික මට්ටමින් සලකා බලන නිර්ණායකවලට අමතරව තම පළාතට අයත් පාසල්වල දුෂ්කරතාව නිසි පරිදි පිළිබිඹු වන ලෙස 5.1 හි සඳහන් වගු අංක 01හි අංක 6ට අදාළව තම පළාතට සුවිශේෂී වූ නිර්ණායක 4 - 7 අතර සංඛ්‍යාවක් හඳුනා ගැනීමට ඉහත පළාත් කමිටුව විසින් කටයුතු කළ යුතුයි. ඒ අනුව පළාත් කමිටුව විසින් යෝග්‍ය යැයි හඳුනා ගනු ලබන නිර්ණායක අධ්‍යාපන ලේකම් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුයි. එසේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ඉහත අංක 5.1 හි සඳහන් වගු අංක 01 ට අනුව ලකුණු ප්‍රදානය කළ යුතුයි.

### 6.2 පාසල් සඳහා ලකුණු පිරිනැමීම

6.2.1 මේ සඳහා 5.1 හි සඳහන් වගු අංක 01 හි දක්වා ඇති නිර්ණායක සහ තම පළාතේ කමිටුව විසින් ඉදිරිපත් කර අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලද නිර්ණායක යොදාගනිමින් තම කලාපයට අයත් සියලුම පාසල් සඳහා පහත සඳහන් උපදෙස් පරිදි ලකුණු ලබා දීමට තම කලාපයේ සැලසුම් විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ අදාළ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහය ඇතිව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුයි.

i. තම කලාපයට අයත් සෑම පාසලක් සඳහා ම පාසල් වර්ගීකරණයට අදාළ නිර්ණායකවලට අනුව ලකුණු ප්‍රදානය කර එක් එක් පාසල සඳහා මුළු ලකුණු ගණනය කළ යුතුයි.

ii. එසේ කලාපයේ සියලුම පාසල් සඳහා එක් එක් නිර්ණායකයට අදාළව ප්‍රදානය කරන ලද ලකුණු ඇමුණුම 1 හි ආකෘතියට ඇතුළත් කර පාසලේ මුළු ලකුණු අනුව සියලුම පාසල් අවරෝහණ පිළිවෙලට (වැඩි අගයේ සිට අඩු අගය දක්වා) පෙළගස්වා එම පාසල් ලේඛන 6.1.1 හි සඳහන් පළාත් මට්ටමේ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුයි.

iii. පළාත් මට්ටමේ කමිටුව විසින් තම පළාතේ සියලු ම කලාපවල පාසල් ලේඛන පරීක්ෂා කර නිවැරදිව ලකුණු පිරිනමා ඇති බවට සහතික කළ යුතුයි.

iv. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තම පළාතේ සියලු ම පාසල් සඳහා එක් එක් නිර්ණායකයට අදාළව ප්‍රදානය කරන ලද ලකුණු සහ මුළු ලකුණු ඇමුණුම 0.1 හි ආකෘතියට ඇතුළත් කර එම පාසල් ලේඛන පළාත් මට්ටමේ කමිටුවේ සහ පළාත් අධ්‍යාපන ලේකම්ගේ නිර්දේශය සහිතව අධ්‍යාපන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුයි.

**6.3 එක් එක් පාසල් වර්ගය සඳහා කඩඉම් ලකුණු තීරණය කිරීම**

6.3.1 දිවයිනේ සියලුම පාසල්වල ලකුණු විශ්ලේෂණය කර එක් එක් පාසල් වර්ගය තීරණය වන අවම කඩඉම් ලකුණු තීරණය කිරීම අධ්‍යාපන ලේකම් විසින් පත් කරනු ලබන කමිටුවක් විසින් සිදු කළ යුතුයි.

6.3.2 එම කඩඉම් ලකුණු අනුව එක් එක් පළාත සඳහා අතිදුෂ්කර පාසල්, දුෂ්කර පාසල්, පහසු පාසල් සහ වඩාත් පහසු පාසල් ලෙස වර්ගීකරණය කරන ලද පාසල් ලේඛන අධ්‍යාපන ලේකම් විසින් ප්‍රකාශයට පත් කරනු ඇත. මෙම පාසල් ලේඛනය වසර 3කට වරක් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.

**6.4 කාල රාමුව**

6.4.1 පාසල් ලේඛනය සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම පහත වගුවේ දක්වා ඇති කාල සීමාව තුළ ඉටු කිරීමට කටයුතු කළ යුතුයි.

| කාර්යය | කාල සීමාව | වගකීම |
|---|---|---|
| 1. පළාත් මට්ටමේ කමිටුව විසින් පළාතට සුවිශේෂී වූ නිර්ණායක හඳුනා ගෙන අනුමැතියට ඉදිරිපත් කිරීම | 2024 මාර්තු 06 ට පෙර | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 2. පළාත් මට්ටමේ නිර්ණායක සඳහා අධ්‍යාපන ලේකම් අනුමැතිය ලබා දීම | 2024 මාර්තු 26 ට පෙර | අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්) |
| 3. කලාපයේ සියලුම පාසල් සඳහා ලකුණු ප්‍රදානය කිරීම, ලේඛන සකස් කිරීම සහ පළාත් මට්ටමේ කමිටුව වෙත අනුමැතියට ඉදිරිපත් කිරීම | 2024 මැයි 03 ට පෙර | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 4. පළාත් මට්ටමේ කමිටුව විසින් ඇමුණුම 1 හි ආකෘතියට අනුව පාසල් ලේඛනය සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම | 2024 මැයි 22 ට පෙර | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 5. අධ්‍යාපන ලේකම් පත් කරන කමිටුව විසින් පළාත් 9හිම පාසල් ලේඛන සමාලෝචනය කර එක් එක් පාසල් වර්ගය තීරණය කරන කඩඉම් ලකුණ ප්‍රකාශයට පත් කිරීම | 2024 ජූනි 26 ට පෙර | අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්) |
| 6. කඩඉම් ලකුණ අනුව සකස් කරන ලද පාසල් ලේඛනය පළාත් වෙත ලබා දීම | 2024 ජූලි 10 ට පෙර | අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්) |

**වගු අංක 2 - කාල රාමුව**

මේ සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය අධ්‍යාපන ලේකම් සතු වේ.

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

**පිටපත්:**

1. ලේකම්, මුදල් අමාත්‍යාංශය
2. සභාපති, මුදල් කොමිෂන් සභාව
3. විගණකාධිපති
4. සියලුම අතිරේක ලේකම්වරු, අධ්‍යාපන අමාත්‍යාංශය
5. කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
6. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
8. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
9. සියලුම අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
10. අභ්‍යන්තර විගණක, අධ්‍යාපන අමාත්‍යාංශය

ඇමුණුම 1

## නිර්ණායකවලට අදාළව ප්‍රදානය කරන ලද ලකුණු ඇතුළත් පාසල් ලේඛනය - ..................................... පළාත

| අනු අංකය | පාසල් සංගණන අංකය | පාසලේ නම | පළාත | කලාපය | කොට්ඨාසය | 1.1 | 1.2 | 1.3 | 1.4 | 1.5 | 2.1.1 | 2.1.2 | 2.2.1 | 2.2.2 | 3.1 | 3.2 | 3.3 | 3.4 | 4.1 | 4.2 | 5 | 6.1 | 6.2 | 6.3 | 6.4 | 6.5 | 6.6 | 6.7 | සමස්ත ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

ඉහත සඳහන් පාසල් සඳහා නිවැරදිව ලකුණු පිරිනමා ඇති බව සහතික කරමි.

| කමිටු සාමාජිකයාගේ නම | තනතුර | අත්සන | නිල මුද්‍රාව |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |
| 6 | | | |
| 7 | | | |

ඉහත පාසල් ලේඛනය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: ............................ නිල මුද්‍රාව:
පළාත් අධ්‍යාපන ලේකම්
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය
........................ පළාත

දිනය: ...........................